www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සරසවිවල පිරිහී යන තත්වයන්ට එරෙහි ශිෂ්‍යයන්ගේ විරෝධතාවලට ශ්‍රී ලංකාවේ පොලීසිය පහර එල්ල කරයි

## Sri Lankan police break up student protests over deteriorating university education

**සුජීව අමරනාත් සහ පානිනී විජේසිරිවර්ධන විසිනි**

**2007 අගොස්තු 15**

පසුගිය ජුලි 30 සහ අගෝස්තු 1 දිනවල කොලඹ උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ කාර්යාලය ඉදිරිපිට දී පැවැත්වුනු ශිෂ්‍ය විරෝධතා දෙකක් බිඳීමට ජල විදින ගජනා ද, බැටන් පොලු ද, කඳුලුගෑස් ද යොදාගත් ශ්‍රී ලංකාවේ පොලීසිය වඩා යහපත් අධ්‍යාපන හා ජීවන පහසුකම් ලබාගැනීමට ද ආන්ඩුව විසින් කරගෙන යනු ලබන නිදහස් අධ්‍යාපන කප්පාදුවට එරෙහිව ද පෙලපාලි දක්වමින් සිටි සිය ගනනක් ශිෂ්‍යයන් පලවා හැරියේ ය.

රජරට විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සම්බන්ධ වූ ප්‍රථම විරෝධතාවයට එල්ල කල පෙලිස් ප්‍රහාරයෙන් තුවාල ලත් ශිෂ්‍යයන් තිදෙනෙක් රෝහල්ගත කරන ලදහ. අත් අඩංගුවට ගත් එක් ශිෂ්‍යයෙක් පසුව නිදහස්කර හරින ලදී. දෙවන දිනයේ දී සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සම්බන්ධ වූ විරෝධතාවයට එල්ල කරන ලද ප්‍රහාරයෙන් තවත් දෙදෙනෙක් රෝහල් ගත කරන ලදහ. මෙම කඳුලුගෑස් ප්‍රහාරය කොතරම් දරුනු වී ද යත් රෝහල තුල සිටි තමන්ගේ රෝගීන්ට පවා එය බල පෑ බව අසල පිහිටි ජාතික රෝහලේ වෛද්‍යවරු ප්‍රකාශ කලහ.

ඉක්බිතිව ශිෂ්‍ය නායකයන් හමුවූ උසස් අධ්‍යාපන අමාත්‍ය විශ්වා වර්නපාල ආන්ඩුව සරසවිවල ප්‍රතිපාදනවලට වෙන් කරන ලද ප්‍රතිපාදන කිසි සේත් ම වැඩි කරන්නේ නැති බවත් මෙම අවුරුද්දේ දී ඒවා සියයට 20කින් කපන බවත් කියා සිටියේ ය. සියයට 20 කැපීමෙන් ඉතිරි ප්‍රතිපාදන පවා "ආන්ඩුවේ ආර්ථික දුෂ්කරතාවන් නිසා" මුදා හැරිය නොහැකි තත්වයක් උද්ගතව තිබෙන බව ඇමතිවරයා තමාට ප්‍රකාශ කලේ යැයි සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යසංගමයේ සභාපති චින්තක ශ්‍රී ශාන්ත ලෝක සමාජවාදී වෙබ් අඩවියට කීවේය.

මෙම "ආර්ථික දුෂ්කරතාවන්ට" හේතුවන ප්‍රධාන සාධකයක් නම් පසුගිය මාස දහය ඇතුලතදී ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි වර්ගවාදී යුද්ධය යලි ආරම්භ කිරීමයි. මිලිටරි ප්‍රහාරයන් සඳහා අවශ්‍යවූ කෝටි ගනන් මුදල් සොයා ගැනීම සඳහා සෑම මට්ටමේ ම අධ්‍යාපනය ඇතුලු අත්‍යාවශ්‍ය සමාජ සේවාවන් කප්පාදු කර දැමීමට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව පියවර ගෙන තිබේ. මෙම තතු තුල වැඩෙන මහා ජනතා විරෝධතාවයට මුහුන දී සිටින ආන්ඩුව එය මර්දනය කිරීම සඳහා පොලීසිය යෙදවීමට කිසිසේත් ම පසුබට වී නැත.

පහරදීමට ලක් වූ මෙම ශිෂ්‍ය විරෝධතාවයන් මෙහෙයවන ලද්දේ ජවිපෙ විසින් පාලනය කරනු ලබන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) විසිනි; අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය මෙම විශ්ව විද්‍යාල ප්‍රතිපාදනයන් කප්පාදුව පිලිබඳව රාජපක්ෂ ආන්ඩුවට බරපතල අභියෝගයක් එල්ල කිරීමට අසමත් ය. එය එසේ වන්නේ එහි දේශපාලන නායකත්වය වන ජනතා විමුක්ති පෙරමුන යුද්ධයට ආධාර කරනවා මදිවාට තවතවත් උග්‍රකරන ලෙස ද රාජපක්ෂ ආන්ඩුවට බලපෑම් යොදමින් සිටින හෙයිනි. ජනතා විමුක්ති පෙරමුනේ සටන් පාඨය වන "පලමුව මව්බිම සෙසු දේවල් පස්සේ" යන්නෙන් කියැවෙන්නේ කම්කරුවන් සහ ශිෂ්‍යයන් මෙම ප්‍රතිගාමී යුද්ධය සඳහා කැපවී ගත යුතුය යන බලකිරීම වේ.

ශිෂ්‍ය නායක චින්තක ශ්‍රී ශාන්ත ආර්ථික දුෂ්කරභාවයන් පිලිබඳව ඇමතිවරයා කල ප්‍රකාශය ගැන අදහස් පල කිරීම ප්‍රතික්ෂේප කරමින් ලෝක සමාජවාදී වෙබ් අඩවියට මෙසේ කීය. "ඇමති තුමා මේ පිලිබඳව වැඩි යමක් කීවේ නැහැ. අපි ඒ පිලිබඳ වැඩි යමක් ඇහුවේත් නැහැ."

ඒ වෙනුවට ජනතා විමුක්ති පෙරමුනේ ශිෂ්‍ය නායකයන් කර ඇත්තේ තත්වය දියුනු කිරීම ගැන සලකා බැලීමට ඇමතිවරයා දුන් පුහු පොරොන්දු පිලිගනිමින් විරෝධතාව දැක්වීම කල් දැමීම යි. වෙනත් වචනවලින් කිවහොත් ඔවුන්ගේ විරෝධතා කැඳවන ලද්දේ ආන්ඩුවට විරුද්ධ වීමේ දේශපාලන ක්‍රියා

මාර්ගයන් මත නොව අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මන්ඩලය කෙරෙහි ශිෂ්‍යයන්ගෙන් දැඩි පීඩනයක් එල්ල වූ නිසා ම පමනි; එම තතු තුල තමන් නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීමට මොනවා හෝ කරන බවක් මවා පෙන්වීමට ඔවුන්ට සිදුවූ හෙයිනි. රැලි දෙකක් සංවිධානය කල ජනතා විමුක්ති පෙරමුනේ ශිෂ්‍ය නායකයෝ තමන්ගේ විරෝධතා රාජපක්ෂගේ යුද සැලසුම්වලට බාධා කිරීමට හේතු විය හැකි නිසා විරෝධතා ව්‍යායාමය ඇනහිටුවා ගෙන සිටිති.

පසුගිය අප්‍රේල් 27 සිට මැයි 7 දක්වා අනධ්‍යයන සේවක මන්ඩලය වැඩ නැවැත්වූ අවස්ථාවේ ද මෙවැනි ම ක්‍රියාවලියක් සිදු විය. ආන්ඩුවේ සහාය ලද සරසවි නිලධාරීහු වැඩ වර්ජක කම්කරුවන්ට කුමන සහනයක් හෝ දීම ප්‍රතික්ෂේප කරමින් වැටුප් වැඩි කිරීමක් නම් කල නොහැකි බව ප්‍රකාශ කලේ ය. එපමනක් නොව වැඩ වර්ජක කම්කරුවෝ මීන් පෙර නොකල විරූ නිවාඩු හා වැටුප් කප්පාදු දඬුවම්වලට භාජන කරන ලදහ. මෙම තතු තුල ජනතා විමක්ති පෙරමුනු වෘත්තීය සමිති නායකයෝ තමන් විසින් පාලනය කරන ඒවා ද ඇතුලුව සෙසු වෘත්තීය සමිති සහ කම්කරුවන් වෙතට ද ශිෂ්‍යයන් වෙතට ද නොහැරුනාහ. ඒ වෙනුවට ඔවුන් කලේ වැඩ වර්ජනය නවතා දැමීම ය.

විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගම් මත තම පාලනය පවත්වා ගෙන යාම සඳහා ජනතා විමුක්ති පෙරමුන තම දේශපාලන විරුද්ධවාදීන් බියගන්වා නිශ්ශබ්ද කරනු වස් මැරවර බලය යොදයි. පසු ගිය සතියේ පේරාදෙනි විශ්වවිද්‍යාලයේ අවිශිබම නායකයෝ සමාජවාදී සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානය විසින් සරසවි භූමියේ පවත්වා ගෙනයමින් තිබූ පොත් විකිනීමක් වලක්වා ලීම සඳහා සසජාශි සාමාජිකයින්ට ශාරීරිකව පහරදීමට තර්ජනය කලහ. ඔවුන් එම තර්ජනය කලේ සසජාශි සාමාජිකයන් ඉරාකයට එරෙහි ඇමරිකාව විසින් මෙහෙයවුනු යුද්ධයට ද ශ්‍රී ලංකවේ යුද්ධයට ද විරුද්ධව වූ සහ නිදහස් අධ්‍යාපනය ඇතුලු ජීවන තත්වයන් ද ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද ආරක්ෂා කිරීම සඳහා වූ ව්‍යායාමයක නිරතව සිටිය දී ය.

## දරුනු වන තත්වයක්

විරෝධතා ව්‍යාපාරවල නිරතව සිටින සරසවි දෙකේ ම ශිෂ්‍යයෝ එක හා සමාන ගැටලුවලට මුහුන දී සිටිති. කොලඹ නගරයෙන් බොහෝ ඈත අනුරාධපුරයේ පිහිටුවා තිබෙන රජරට විශ්වවිද්‍යාලය දරුනු ගුරු හිඟයකින් පීඩා විඳිමින් සිටී. උදාහරනයක් හැටියට පාලකයන් විසින් අධ්‍යාපන අංශයේ ගුරු තනතුරු 33කින් පුරවා ඇත්තේ 22ක් පමනකි. එම එකම ආචාර්ය වරයෙකුටවත් එකම ගුරුවරයෙකුටවත් ආචාර්ය උපාධියක් නැත. කලමනාකාරනය, සමාජවිද්‍යාව සහ මානව ශාස්ත්‍ර අංශයන්ට වෙන වෙනම ගොඩනැගිලි ඇත්තේ ද නැත. කියවීම් ශාලාවේ අධ්‍යයනය සඳහා ඉඩපහසුකම් නැත. ක්‍රීඩා පහසුකම් ද නැත.

1996 දී රජරට විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලද්දේ සීමිත නිවාස වැඩ පිලිවෙලක් සඳහා තනන ලද හිස් ගොඩනැගිලිවගයක් තුල ය. පහසුකම් නිවැරදිව ගොඩ නොනගන ලද එය කිසිසේත් ම සරසවියකට ගැලපුනේ නැත. ශිෂ්‍ය නිවාස පහසුකම් නැතිවීම දැවෙන ප්‍රශ්නයකි. නේවාසික පහසුකම් ඇත්තේ 2204ක් වූ සිසු ගහනයෙන් 782කට පමනි. ඉතුරු අයට ජීවත් වීමට සිදු වී ඇත්තේ තනි කාමරයක ශිෂ්‍යයන් 6ක් හෝ 8ක් ගාල් කෙරුනු තත්ව හීන නිවාසවල ය. රංග කලා සහ සෞන්දර්ය කලා සඳහා රටේ එකම ආයතනය වන කොලඹ පිහිටි සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ දේශක තනතුරු 154කින් පුරවන් ලැබ ඇත්තේ 83ක් පමනි. දේශකයින් නැතිකම නිසා නාට්‍ය ඉතිහාසය සහ ප්‍රායෝගික සංගීතය යන අංශ මුලුමනින්ම ඇනහිට ඇත. බටහිර සංගීතයට අවශ්‍ය දේශකයින් 15ක ගෙන් අත්තේ දෙදෙනෙක් පමනි.

බොහෝ අධ්‍යාපන අංශ අනධ්‍යයන සේවකයන් නැතිකම නිසා ද පොදු කාර්ය පිරිවැය හීන වීම නිසා ද පීඩාවට ලක්ව පවතී. නාට්‍ය ශාලාවක් ශබ්ද සංරක්ෂනය කිරීමේ ස්ටුඩියෝවක් හෝ පරිගනක අංශයක් හෝ ඇත්තේ ම නැත. දෘෂ්‍යකලා අංශයන්හි ඉතාම මූලික උපකරන වන වායුසංපීඩකයන් ඩිජිටල් කැමරා හා මුද්‍රන යන්ත්‍ර නැතිකම නිසා වැඩ කර ගත නොහැකිව සිටිති. 1974 තනන ලද ගොඩනැගිලි හැර අන් කිසි ගොඩනැගිල්ලක් නොමැති මෙහි අමතරව පාවිච්චියට ගනු ලබන්නේ කුලියට ගත් ගොඩනැගිලි කීපයක් පමනි. 3180ත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සරසවි භූමියේ නේවාසික පහසුකම් ඇත්තේ 320 දෙනෙකුට පමනි. ඉතිරි සියලු දෙනා රඳවනු ලැබ ඇත්තේ සමහර විට කිලෝ මීටර් 20ක් තරම් ඈත කුලියට ගනු ලැබූ ගොඩනැගිලිවලය.

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය වර්ධනය වූයේ කම්කරු පන්තියේ පශ්චාත් යුදකාලීන අරගලවල ඵලයක් ලෙස ය. 1980 දී එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමත් සමග ආරම්භ කරන ලද ප්‍රතිව්‍යුහගත වැඩ පිලිවෙල ආරම්භ කල තැන් පටන් නිදහස් අධ්‍යාපනය දිගින් දිගටම බාදනය වී ඇත. එම ධවල පත්‍රිකාවේ ප්‍රධාන යෝජනාවලට පෞද්ගලික පාසල් පිහිටුවීම ද උපාධි ප්‍රදානය කිරීමේ පෞද්ගලික ආයතනයන් පිහිටුවීම ද ඇතුලත් විය. සල්ලිකාරයන්ගේ දූපුතුන් සඳහා ශාඛාවන් පිහිටුවීම ද වැඩි ගාස්තු අය කරන විදේශීය විශ්වවිද්‍යාලයන්ට දොර හැර දීමද කරන ලදී.

රජරට විශ්වවිද්‍යාලය වැනි විශ්වවිද්‍යාල පිහිටුවන ලද්දේ විශ්වවිද්‍යාල තුල ඉඩනැති කම පිලිබඳව වැඩී එන්නාවූ විරෝධතාව මැද්දැවේ ය. එහෙත් ගැටලුව විසඳ ලීමට එය සමත් වූයේ නැත.

මෙවන් සීමා සහිත ප්‍රසාරනයකින් පසුව ලංකාවේ විශ්වවිද්‍යාලවලට ඇතුලු වීමට වරම් ලබන්නෝ සුදුසුකම් ඇති ශිෂ්‍යයන්ගෙන් සියයට 15කි. උදාහරනයක් හැටියට 2006 දී සරසවිතුලට ඇතුල්වීමට ලකුනු ලබා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 115,000 විය. ඉන් වරම් ලද්දෝ 17,630කි. රාජපක්ෂ ආන්ඩුව විසින් ඉදිරියට ගෙනයනු ලබන කප්පාදුව නිදහස් සරසවි අධ්‍යාපනයට එල්ල වූ මාරක ප්‍රහාරය තව දුරටත් උග්‍ර කර ඉදිරියට ගෙනයාමකි.

© www.wsws.org